# 2024 අප්‍රේල්

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## ඉදිකිරීම්

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA

**පසුගිය වසරවල අලුත් අවුරුදු සමයේ පැවති රටාවට අනුගතව බොහෝ අංශවල ක්‍රියාකාරකම් මන්දගාමීවීම තුළ, ඉදිකිරීම් අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ද අප්‍රේල් මාසයේ දී දර්ශකාංක 31.9ක් දක්වා පහත වැටීමක් වාර්තා කරන ලදී.** මෙමගින් ඉදිකිරීම් ක්‍රියාකාරකම් පසුගිය මාසයට සාපේක්ෂව පහත වැටීමක් පෙන්නුම් කරයි. සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කළ පරිදි, දීර්ඝ අලුත් අවුරුදු නිවාඩුව හේතුවෙන් බොහෝ ඉදිකිරීම් වැඩබිම් මෙම මාසය තුළ තාවකාලිකව වසා දැමීම මෙම පසුබැසීමට හේතු වී ඇත.

නව ඇණවුම් පහත වැටීම සඳහා අප්‍රේල් මාසයේ වැඩ කරන දින ප්‍රමාණය අඩු වීම හේතු විය. කෙසේ වෙතත්, බොහෝ ප්‍රතිචාර දැක්වූවන්ගේ මතය වූයේ ටෙන්ඩර් අවස්ථා ක්‍රමයෙන් වැඩිවන ප්‍රවණතාවය ඉදිරි මාසවලදී ද පවතිනු ඇති බවයි. තවද, වෙළඳපොළ තුළ පවතින ඉහළ තරගකාරීත්වය පිළිබඳව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. සමස්ත ක්‍රියාකාරකම් සහ නව ඇණවුම් පහත වැටීම හා සමගාමීව, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් මෙම මාසය තුළ දී පහළ යන ලදී. තවද, මිල මට්ටම්වල පහත වැටීමේ ප්‍රවණතාවය අප්‍රේල් මාසය තුළ දී ද පෙන්නුම් කරයි. මේ අතර, මෙම මාසය තුළ දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පෙර මාසයට සාපේක්ෂව අඩු වේගයකින් ඉහළ යන ලදී.

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | මාර්. | අප්‍රේ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)** | **55.9** | **31.9** | - | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| නව ඇණවුම් | 51.5 | 37.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 44.1 | 38.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 55.9 | 29.2 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 52.9 | 51.4 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

එළඹෙන මාස තුන තුළ ඉදිකිරීම් කටයුතු සඳහා වන ඉදිරි දැක්ම යහපත් වන අතර, මෙයට ප්‍රධාන වශයෙන් නව ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ඇති ඉහළ අපේක්ෂා හේතු විය.

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)** **31.9**

**2024 අප්‍රේල්**

**ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ප්‍රංශය | අඩු වේගයකින් පහත වැටීමක් |
| ජර්මනිය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| අයර්ලන්තය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉතාලිය | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 මැයි 30 වන දිනට*

[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාළ මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| තොග මිලදී ගැනුම් | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.